// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2250/35 – 2021 ඔක්තෝබර් මස 22 වැනි සිකුරාදා – 2021.10.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) යටතේ ආඥාව

**2021 අංක 206 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/4/2016/D/91.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: ව/18/02/2014.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) ආඥාවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව ඉඩම් අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම භුක්තියට ගැනීමට මෙයින් නියම කරමි.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

2021 සැප්තැම්බර් මස 15 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී.–** ප්‍රාදේශීය ලේකම්, වත්තල.

2. **ඉඩමේ විස්තරය.–** බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රාගම් පත්තුව සුළු කොට්ඨාසයේ, 179, ඇලපිටිවල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, නවම්මහර ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද ගම් 4121 හා 2018.12.03 දිනැති මූලික පිඹුරේ පහත සඳහන් ඉඩම් කොටසට මායිම්:

1. **කැබලි අංක 1 – කජුගහකුඹුර – ප්‍රමාණය: හෙක්. 0.0671**

උතුරට: ගම් 3992 වැනි මූලික පිඹුරේ කැබලි අංක 2 සහ A1709 වැනි මූලික පිඹුරේ කැබලි අංක 41; නැගෙනහිරට: A1709 වැනි මූලික පිඹුරේ කැබලි අංක 41 සහ 42; දකුණට: A1709 වැනි මූලික පිඹුරේ කැබලි අංක 42; බටහිරට: ගම් 3992 වැනි මූලික පිඹුරේ කැබලි අංක 2.

11 – 60

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2021 අංක 201 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/12/2018/WS/283.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: BDD/LND/02/104-2018.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව ඉඩම් අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට *නැතහොත්*, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

2021 සැප්තැම්බර් මස 15 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී.–** ප්‍රාදේශීය ලේකම්, බද්දේගම.

2. **ඉඩමේ විස්තරය.–** දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, බද්දේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 184-ඒ, නයාපාමුල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, නයාපාමුල ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක GA/BDD/2019/1048 හා 2020.01.29 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත ඉඩම් කැබලිවලට මායිම්:

1. **කැබලි අක්ෂර ‘A’ – කන්දේඅද්දරවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0013**

උතුරට: ඩී. ජී. වයි. අයි. අබේරත්න හිමිකම් කියන කන්දේ අද්දරවත්ත; නැගෙනහිරට සහ දකුණට: කැබලි අක්ෂර B; බටහිරට: ඉසිපතන විහාරස්ථානය හිමිකම් කියන කන්දේ අද්දරවත්ත සහ ඩී. ජී. වයි. අයි. අබේරත්න හිමිකම් කියන කන්දේ අද්දරවත්ත.

2. **කැබලි අක්ෂර ‘B’ – කන්දේඅද්දරවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0012**

උතුරට: කැබලි අක්ෂර A සහ ඩී. ජී. වයි. අයි. අබේරත්න හිමිකම් කියන කන්දේ අද්දරවත්ත; නැගෙනහිරට සහ දකුණට: මාර්ගය; බටහිරට: ඉසිපතන විහාරස්ථානය හිමිකම් කියන කන්දේ අද්දරවත්ත සහ කැබලි අක්ෂර A.

11 – 61

---

## නිවැරදි කිරීමයි

ඉඩම් අමාත්‍යාංශය විසින් යොමුකර ඇති 2021 අංක 151 දරන 38 වැනි වගන්තිය (අ) යටතේ ආඥාව අංක 2238/5 සහ 2021.07.27 දිනැතිව ගැසට් පත්‍රයේ පළකර ඇත. එහි සිංහල භාෂාවෙන් පළකරන ලද අංක 151 දරන ආඥාව ''38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව'' ලෙස දෝෂ සහිතව පළවී ඇත.

එබැවින් එම දැන්වීම ''38 වැනි වගන්තිය (අ) යටතේ ආඥාව'' ලෙස නිවැරදි විය යුතු බව දන්වා සිටිමි.

සහකාර අධ්‍යක්ෂ,
(ඉඩම් අත්පත්)
ඉඩම් අමාත්‍යාංශය.

2021 ඔක්තෝබර් මස 07 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

11 – 91

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.